# ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රය

**අංක 1,863 - 2014 මැයි මස 16 වැනි සිකුරාදා - 2014.05.16**

(රජයේ බලයපිට ප්‍රසිද්ධ කරන ලදී.)


# IV (ආ) වැනි කොටස - පළාත් පාලනය

(වෙන වෙනම ගොනු කර ගත හැකි පරිදි සෑම කොටසකට ම අයත් එක් එක් භාෂාවකට වෙන වෙනම පිටු අංක යොදා ඇත )


| | පිටුව |
|---|---|
| තනතුරු-ඇබෑර්තු ... ... ... ... | 680 |
| විභාග, විභාග ප්‍රතිඵල ආදිය ... ... ... ... | — |
| පළාත් පාලන නිවේදන ... ... ... ... | 685 |
| අතුරු ව්‍යවස්ථා ... ... ... ... | — |
| පළාත් පාලන සහා ඡන්ද ආඥාපනත යටතේ දැන්වීම ... | — |
| ආදායම් හා වියදම් පිළිබඳ ප්‍රකාශන ... ... ... | 687 |
| අයවැය ලේඛන ... ... ... | — |
| දේපළ විකිණීම් ... ... ... | — |
| විවිධ දැන්වීම් ... ... ... | — |


*සැ. යු.* - විසිදෙවන ආණ්ඩුක්‍රම ව්‍යවස්ථා සංශෝධනය පනත් කෙටුම්පත 2014 අප්‍රේල් මස 25 වැනි දින *ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රයේ* II වැනි කොටසේ අතිරේකයක් වශයෙන් පළකරන ලදී.

**සතිපතා නිකුත් වන ගැසට් පත්‍රයෙහි පළකිරීම සඳහා භාරගනු ලබන දැන්වීම් පිළිබඳ**

## වැදගත් නිවේදනයයි

ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ *ගැසට් පත්‍රයේ* අවසන් පිටුවේ සෑම මාසයකම මුල් සතියේ දී පළ කරන නිවේදන භාරගන්නා දිනයන් සහ වේලාවන් පිළිබඳව මින් අවධානය යොමු කරනු ලැබේ.

*ගැසට් පත්‍රයේ* පළ කිරීම සඳහා දැන්වීම් භාරගැනීම *ගැසට් පත්‍රය* පළකරනු ලබන දිනයට සති දෙකකට පෙර සිකුරාදා දිනයෙහි දහවල් 12.00 ට අවසන් කරනු ලැබේ. තනතුරු - ඇබෑර්තු, විභාග, ටෙන්ඩර් සහ වෙන්දේසි පිළිබඳ දැන්වීම්වල අවසන් දින සහ වේලාවන් ඒ පිළිබඳව උනන්දුවක් දක්වන අයට ප්‍රමාණවත් කාල වේලාවක් ලැබෙන පරිදි යොදාගත යුතු බවට, සියලු ම දෙපාර්තමේන්තු, සංස්ථා සහ මණ්ඩල යනාදිය වගබලාගත යුතු බව මින් අවධාරණය කෙරේ. පළකිරීම සඳහා එවනු ලබන සෑම දැන්වීමක් ම තනි පැත්තේ පමණක් පැහැදිලිව පිටපත් කළ යුතුය. නිරවද්‍යතාවය පිළිබඳව කරන විමසීම් සහ පැමිණිලි *ගැසට් පත්‍රය* පළ වූ දින සිට තෙමසකට පසුව භාරගනු නොලැබේ.

*ගැසට් පත්‍රයේ* පළ කරන සෑම දැන්වීමක් ම *ගැසට් පත්‍රය* පළ කරනු ලබන දිනට සති දෙකකට පෙර එනම්, 2014 ජුනි මස 06 දින පළ කෙරෙන *ගැසට් පත්‍රයේ* දැන්වීම් 2014 මැයි මස 23 වැනි දින දහවල් 12.00ට හෝ ඊට පෙර තැපෑලෙන් හෝ ගෙනවිත් රජයේ මුද්‍රණාලයට භාරදිය යුතු ය.

**2006 අංක 19 දරන ඉලෙක්ට්‍රොනික ගණුදෙනු පනත - 9 වැනි වගන්තිය.**

*"යම් ප්‍රකාශනයක්, රීතියක්, නියෝගයක්, නියමයක්, අතුරු ව්‍යවස්ථාවක්, නිවේදනයක් හෝ වෙනත් කිසිවක් ගැසට් පත්‍රයේ පළ කළ යුතු බවට යම් පනතකින් හෝ නීති ප්‍රඥප්තියකින් විධිවිධාන සලස්වා ඇති අවස්ථාවක, ඒ රීතිය, නියෝගය, නියමය, අතුරු ව්‍යවස්ථාව, නිවේදනය හෝ වෙනත් දෙය ඉලෙක්ට්‍රොනික ස්වරූපයේ වන ගැසට් පත්‍රයක පළ කරනු ලැබුවහොත් ඒ විධිවිධානය සම්පූර්ණකර ඇත්තාක් සේ සැලකිය යුතුය."*

**පී. එච්. එල්. වී. ද සිල්වා,**
රජයේ මුද්‍රණාලයාධිපති. *(වැ.බ.)*

2014 ජනවාරි මස 01 වැනි දින,
කොළඹ 08,
රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුවේ දී ය.

*මෙම ගැසට් පත්‍රය www.documents.gov.lk වෙබ් අඩවියෙන් බාගත කළ හැක.*

# තනතුරු - ඇබෑර්තු

## ගල්ගමුව ප්‍රාදේශීය සභාව

ප්‍රාථමික ශිල්පීය හා ශිල්පීය නොවන සේවක ගණයේ III ශ්‍රේණියේ තනතුරු සඳහා බඳවා ගැනීමට 2014.03.28 දින පළකරන ලද ගැසට් නිවේදනය අවලංගු කිරීම

උක්ත ගැසට් නිවේදනය මගින් බඳවා ගැනීමට නියමිත තනතුරු සඳහා මහා භාණ්ඩාගාරය මගින් ප්‍රතිපාදන ලබාදීම ප්‍රමාද කිරීම හේතුවෙන් අදාල බඳවා ගැනීම් දින නියමයක් නොමැතිව කල් දමා ඇති බව මෙයින් දැනුම්දෙන අතර මේ සඳහා නැවත ගැසට් නිවේදනයක් මගින් ඉල්ලුම්පත් කැඳවා බඳවා ගැනීම් සිදුකරන බව ද දැනුම් දෙමි. මේ අනුව දැනට ඉල්ලුම්පත්‍ර යොමු කර ඇති අයදුම්කරුවන් ද නැවත අදාල තනතුරු සඳහා අයදුම්කළ යුතු බව ද වැඩිදුරටත් දැනුම් දෙමි.

ඒ. බී. නිමල් රත්නායක,
ලේකම්,
ගල්ගමුව ප්‍රාදේශීය සභාව.

2014 අප්‍රේල් මස 28 වැනි දින,
ගල්ගමුව ප්‍රාදේශීය සභාවේ දී ය.

05-483

---

## හොරණ නගර සභාව

### ගිනිහට තනතුරු පුරප්පාඩු

බස්නාහිර පළාත් රාජ්‍ය සේවයේ හොරණ නගර සභාවේ ගිනිහට තනතුර සඳහා පහත සුදුසුකම් සපුරා ඇති බස්නාහිර පළාතේ ස්ථිර පදිංචිකරුවන්ගෙන් (පිරිමි) පමණක් අයදුම්පත් කැඳවනු ලැබේ.

*අධ්‍යාපන හා අනෙකුත් සුදුසුකම් :*

- අයදුම්කරුවන් ශ්‍රී ලාංකික පුරවැසියන් විය යුතුය.
- අ.පො.ස. (සා.පෙළ) විභාගයෙන් අඩු වශයෙන් වාර 02ක දී සිංහල/දෙමළ/ගණිතය සහ විද්‍යාව ඇතුළු විෂයන් 06ක් සමත්විය යුතු අතර ඉන් විෂයන් 05ක් එක් අවස්ථාවකදී සමත් වී තිබිය යුතුය.
- අයදුම්පත් භාර ගන්නා අවසාන දිනට වයස අවුරුදු 19ට නොඅඩු විය යුතු අතර අවුරුදු 25ට නොවැඩි විය යුතුය.
- අයදුම්පත් භාර ගන්නා අවසන් දිනට පූර්වාසන්නව බස්නාහිර පළාත තුළ අවම වශයෙන් වසර 03 ක ස්ථිර පදිංචියක් තිබිය යුතුය.
- උස අඩි 05 අඟල් 04ක අවම උසකින් යුක්ත විය යුතුය.
- බර රාත්තල් 125ක අවම බරකින් යුක්ත විය යුතුය.
- අයදුම්කරුවන් අවිවාහක විය යුතුය.
- විශිෂ්ඨ චරිතයකින් හා මනා ශාරීරික සෞඛ්‍යයකින් යුක්ත විය යුතුය.
- යම් කිසි සාපරාධී වරදකට කෙදිනක හෝ උසාවියකදී වරදකරුවෙකු වී නොමැති අයෙකු හෝ රාජ්‍ය /පළාත් රාජ්‍ය සේවාවකින් පහකළ අයෙකු නොවිය යුතුය.

*සේවා කොන්දේසි හා නියමයන් :*

- මෙම තනතුර ස්ථිරය. විශ්‍රාම වැටුප් සහිතය.
- තෝරාගනු ලබන අයදුම්කරුවන් රජයේ සහ බස්නාහිර පළාත් සභාවේ නියෝගවලට හා රෙගුලාසිවලට ද හොරණ නගර සභාව විසින් නියම කරනු ලබන කොන්දේසිවලට ද අනුකූලව ක්‍රියාකල යුතුය.
- තෝරාගනු ලබන අයදුම්කරුවන් එක් අවුරුදු පුහුණු පාඨමාලාවක් හැදෑරිය යුතු අතර, ඔවුන් පුහුණුව නිම කිරීමෙන් අනතුරුව වර්ෂ 05 ක කාලසීමාවක් බස්නාහිර පළාත් රාජ්‍ය සේවයේ සේවය කරන බවට රු. 10,000 වටිනාකමකින් යුතු බැඳුම්කරයක් අත්සන් කළ යුතුය.
- පුහුණුව සාර්ථකව නිමකිරීමෙන් අනතුරුව රා.ප.ච. 6/2006 (iv) අනුව RS1-2006A වැටුප් කාණ්ඩයේ රු. 14280-7x145-10x180-17x240-21175 ක් වූ වැටුප් පරිමාණයෙ හි පිහිටුවනු ලැබේ.
- ගිනි හටයෙකු වශයෙන් පත්වීම් ලැබූ විට එම පත්වීම්ලාභීන් හොරණ නගර සභා බල ප්‍රදේශයේ පදිංචිවීම අනිවාර්ය වේ.

*බඳවා ගැනීමේ ක්‍රමය :*

සුදුසුකම් ලබන අයදුම්කරුවන් සාමාන්‍ය බුද්ධිය පරීක්ෂා කිරීම සඳහා වන පැය 01 ප්‍රශ්න පත්‍රයකට පෙනී සිටිය යුතුය. එම පරීක්ෂණයෙන් සුදුසුකම් ලබන්නන් ශාරීරික යෝග්‍යතාවය පරීක්ෂා කිරීම සඳහා යෝග්‍යතා පරීක්ෂණයකට පෙනී සිට ඉන් අනතුරුව සුදුසුකම් පිළිබඳ සහතික පරීක්ෂා කිරීමේ සම්මුඛ පරීක්ෂණයකට පෙනී සිටිය යුතුය. තෝරාගනු ලබන අයදුම්කරුවන් වෛද්‍ය පරීක්ෂණයකට පෙනී සිට සමත් විය යුතුය.

*අයදුම්පත් :*

අයදුම්කරුවන් මෙහි පහත පළවන ආදර්ශ අයදුම්පත්‍රයට අනුව පිළියෙල කරගත් අයදුම්පත් ඒ4 ප්‍රමාණයේ කඩදාසියක දෙපැත්තේ යතුරු ලියනය කර හෝ පැහැදිලිව අත් අකුරින් පිළියෙල කර ඉදිරිපත් කළ යුතුය. අයදුම්පත්‍රයේ අංක 10 අවසානය දක්වා එක් පිටුවකත් අංක 11 සිට ඉදිරියට අනෙක් පිටුවේත් වන සේ අයදුම්පත්‍ර පිළියෙල කර ගත යුතුය. එසේ පිළියෙල කරගත් අයදුම්පත් 2014.05.31 දිනට හෝ ඊට පෙර ලැබෙන සේ ලියාපදිංචි තැපෑලෙන් "ලේකම්, හොරණ නගර සභාව, හොරණ" යන ලිපිනයට එවිය යුතුය. අයදුම්පත් බහා එවන ලියුම්කවරයේ වම්පස ඉහළ කෙළවරේ "බස්නාහිර පළාත් රාජ්‍ය සේවයේ ගිනිහට තනතුර සඳහා අයදුම්පත්‍රය" යනුවෙන් සඳහන් කළ යුතු ය.

රාජ්‍ය/පළාත් රාජ්‍ය සේවයේ/රාජ්‍ය සංස්ථා/ව්‍යවස්ථාපිත මණ්ඩල සේවකයින් විසින් ඉදිරිපත් කරනු ලබන අයදුම්පත් තම දෙපාර්තමේන්තු/ආයතන ප්‍රධානියා මගින් ඉදිරිපත් කළ යුතුය. අසම්පූර්ණ හෝ නියමිත දිනට පසුව ලැබෙන අයදුම්පත් සලකා බලනු නොලැබේ.

අයදුම්පත් භාර ගැනීමෙන් අනතුරුව විභාගය පවත්වනු ලබන දිනය අයදුම්කරුවන්ට පෞද්ගලිකව දැනුම් දෙනු ලැබේ. විභාගය පැවැත්වීම කල් තැබීම හෝ අවලංගු කිරීමේ බලය හොරණ නගර සභාවේ ලේකම් සතු ය.

පී. ජී. පී. රොද්‍රිගෝ,
ලේකම්,
නගර සභාව - හොරණ.

2014 අප්‍රේල් මස 22 වන දින,
හොරණ නගර සභාව.

**බස්නාහිර පළාත් රාජ්‍ය සේවයේ හොරණ නගර සභාවේ ගිනිහට තනතුර සඳහා ආදර්ශ අයදුම්පත්‍රය**

01. (අ) මුලකුරු සමග නම :——————————.
(ආ) මුලකුරු වලින් හැඳින්වෙන නම් :——————————.
02. ස්ථිර ලිපිනය :——————————.
03. (අ) දිස්ත්‍රික්කය :——————————.
(ආ) පදිංචි ස්ථානය අයත් ග්‍රාම නිලධාරී වසම හා අංකය :——————————.
04. (අ) උපන් දිනය හා ස්ථානය :——————————.
(ආ) අයදුම්පත් භාර ගන්නා 2014.05.31 දිනට වයස
අවුරුදු :——————————. මාස :——————————. දින :——————————.
05. ජාතික හැඳුනුම්පත් අංකය:——————————.
06 .විවාහක/අවිවාහක:——————————.
07. බස්නාහිර පළාත තුළ පදිංචි කාල සීමාව —————————— සිට.—————————— දක්වා :——————————.
08. උස : අඩි :——————————. අඟල්:——————————.
09. බර : රාත්තල්:——————————.
10. අධ්‍යාපන සුදුසුකම් (සමත් විභාගය හා විෂයයන් සඳහන් කරන්න./ප්‍රතිඵල ලේඛනයේ පිටපතක් අමුණන්න)
අ.පො.ස. (සා.පෙළ) විභාගය, වර්ෂය:——————————.

| *විෂයයන්* | *සාමාර්ථය* |
|---|---|
| ——————————. | ——————————. |
| ——————————. | ——————————. |
| ——————————. | ——————————. |
| ——————————. | ——————————. |
| ——————————. | ——————————. |
| ——————————. | ——————————. |
| ——————————. | ——————————. |
| ——————————. | ——————————. |

11. වෙනත් සුදුසුකම් :——————————.
12. ඔබ කිසියම් සාපරාධී වරදක් සම්බන්ධයෙන් කෙදිනකදී හෝ උසාවියකදී වරදකරු වී තිබේද ? (ඔව්/නැත) (ඔබගේ පිළිතුර පැහැදිලි අත් අකුරෙන් ලියන්න) "ඔව්" නම් වරදේ ස්වභාවය හා දඬුවම කුමක්ද ? :——————————.
13. ඔබ රාජ්‍ය/පළාත් රාජ්‍ය සේවයෙන් මීට පෙර සේවයෙන් පහකල හෝ ඉල්ලා අස්වූ තැනැත්තෙක් ද? (ඔව්/නැත) ——————————.
(ඔබගේ
පිළිතුර පැහැදිලි අත් අකුරෙන් ලියන්න) :——————————.

ඉහත සඳහන් කරුණු සත්‍ය හා නිවැරදි බව ප්‍රකාශ කරමි. මෙහි සඳහන් කරුණු අසත්‍ය බව හෝ වැරදි බව මා තෝරා ගැනීමට පෙර අනාවරණය වුවහොත් මා නුසුදුස්සකු වන බවත්, පත් කිරීමෙන් පසු ඒ බව අනාවරණය වුවහොත් කිසිදු වන්දියකින් තොරව මා සේවයෙන් පහ කළ හැකි බවත් මම දනිමි.

——————————.
අයදුම්කරුගේ අත්සන.

දිනය:——————————.

දැනටමත් රාජ්‍ය සේවයේ හෝ කිසියම් පළාත් රාජ්‍ය සේවයක හෝ රාජ්‍ය සංස්ථාවක සේවයේ නියුක්ත අයදුම්කරුවන් පමණක් පහත කොටස සම්පූර්ණ කර එවිය යුතු ය.

මෙම ඉල්ලුම්පත්‍රය ඉදිරිපත් කරන ———————————— නැමැති අයදුම්කරු ———————————— වන දින සිට මෙම ආයතනයේ සේවය කරන බවත්, ඔහුගේ වැඩ හා හැසිරීම නිරන්තරයෙන්ම සතුටුදායක බවත්ව, ඔහුට විරුද්ධව විනයානුකූලව ක්‍රියාකර නොමැති අතර ඉදිරියේදී විනයානුකූලව ක්‍රියාකිරීමට අදහස් කර නොමැති බවත්, ඉහත සඳහන් අයදුම් පත්‍රයේ සඳහන් කර ඇති තොරතුරු මෙම කාර්යාලයේ ඇති වාර්තා අනුව නිවැරදි බවත් සහතික කරමි. මෙම තනතුර සඳහා ඔහු තෝරා ගනු ලැබුවහොත් වහාම මුදා හැරීම කළ හැකි/නොහැකි බවද දන්වමි.

————————————.
ආයතන ප්‍රධානියාගේ අත්සන
සහ නිල මුද්‍රාව.

දිනය :————————————.

05-503

---

**දකුණු පළාත් රාජ්‍ය සේවයේ පුරප්පාඩු පිරවීම**

වැලිවිටිය - දිවිතුර ප්‍රාදේශීය සභාව

වැලිවිටිය - දිවිතුර ප්‍රාදේශීය සභාවේ පුරප්පාඩු වී ඇති පහත උපලේඛනයේ සඳහන් තනතුරු වලට බඳවා ගැනීම සඳහා වැලිවිටිය - දිවිතුර ප්‍රාදේශීය සභා බල ප්‍රදේශය තුළ පදිංචි පහත සඳහන් සුදුසුකම් ඇති අයදුම්කරුවන්ගෙන් අයදුම්පත් කැඳවනු ලැබේ.

| *තනතුරු නාමය* | *තනතුරු සංඛ්‍යාව* | *වැටුප් කේත අංකය* | *වැටුප් පරිමාණය* | *අවම අධ්‍යාපනික සුදුසුකම්, වෘත්තීය සුදුසුකම් හා පළපුරුද්ද* | *පොදු සුදුසුකම්* |
|---|---|---|---|---|---|
| සෞඛ්‍ය කම්කරු | 02 | PL1- (2006A ) | රු. 11,730 - 10 x 120 - 10 x 130 -10 x 145 - 12 x 160 - රු. 17,600 | 08 වැනි ශ්‍රේණිය (09 වසර) සමත් වීම. | ශ්‍රී ලංකාවේ පුරවැසියෙක් විය යුතුයි. විශිෂ්ඨ චරිතයකින් යුක්ත විය යුතුයි. අයදුම්පත් භාර ගන්නා අවසන් දිනට පූර්වාසන්න වසර 03 ක් දකුණු පළාත තුළ ස්ථිර පදිංචිකරුවකු විය යුතුයි. පදිංචි වසමේ ග්‍රාම නිලධාරි විසින් නිකුත් කරන ලද සහතිකය මත අදාළ ප්‍රාදේශීය ලේකම් විසින් අනු අත්සන් කර, නිකුත් කරන ලද ලියවිල්ලකින් පදිංචිය සනාථ කළ යුතු ය.<br>තනතුරට බඳවා ගැනීම සඳහා අවශ්‍ය සියලුම සුදුසුකම් සම්පූර්ණ කළ යුතු බවට අයදුම්පත් කැඳවීමේ නිවේදනයේ /ගැසට් පත්‍රයේ සඳහන් කරනු ලබන දිනට එම සුදුසුකම් සෑම ආකාරයකින් සම්පූර්ණ කර තිබිය යුතුයි. |
| රියදුරු | 01 | PL -3 (2006A) | රු. 12,470- 10 x 130 - 10 x 145 - 10 x 160 - 12 x 170 - රු.18,860 | දෙවරකට නොවැඩි වාර ගණනකදී අධ්‍යයන පොදු සහතික පත්‍ර සාමාන්‍ය පෙළ විභාගයෙන් ඕනෑම විෂයයන් 06 ක් සමත් වීම.<br>මෝටර් රථ ප්‍රවාහන කොමසාරිස් ජනරාල් විසින් නිකුත් කරන ලද බලපත්‍රයක් හා නිපුණත්වය පිළිබඳ සහතිකයක් ලබා තිබිය යුතුයි. (අවම වශයෙන් වසර 03 ක පළපුරුද්ද ලබා තිබිය යුතුයි.) | - එම- |

| තනතුරු නාමය | තනතුරු සංඛ්‍යාව | වැටුප් කේත අංකය | වැටුප් පරිමාණය | අවම අධ්‍යාපන සුදුසුකම්, වෘත්තීය සුදුසුකම් හා පළපුරුද්ද | පොදු සුදුසුකම් |
|---|---|---|---|---|---|
| ක්ෂේත්‍ර කම්කරු/වැඩ කම්කරු | 01 | PLI-(2006A) | රු. 11,730- 10 x 120 - 10 x 130 10 x 145 - 12 x 160 - රු. 17,600 | 08 වැනි ශ්‍රේණිය (09 වසර) සමත්වීම | ශ්‍රී ලංකාවේ පුරවැසියෙක් විය යුතුයි. විශිෂ්ඨ චරිතයකින් යුක්ත විය යුතුයි. අයදුම්පත් භාර ගන්නා අවසන් දිනට පූර්වාසන්න වසර 03 ක් දකුණු පළාත තුළ ස්ථිර පදිංචිකරුවකු විය යුතුයි. පදිංචි වසමේ ග්‍රාම නිලධාරි විසින් නිකුත් කරන ලද සහතිකය මත අදාළ ප්‍රාදේශීය ලේකම් විසින් අනු අත්සන් කර, නිකුත් කරන ලද ලියවිල්ලකින් පදිංචිය සනාථ කළ යුතු ය.<br><br>තනතුරට බඳවා ගැනීම සඳහා අවශ්‍ය සියලුම සුදුසුකම් සම්පූර්ණ කළ යුතු බවට අයදුම්පත් කැඳවීමේ නිවේදනයේ /ගැසට් පත්‍රයේ සඳහන් කරනු ලබන දිනට එම සුදුසුකම් සෑම ආකාරයකින් සම්පූර්ණ කර තිබිය යුතුයි. |

*වෙනත් :*

01. වැලිවිටිය - දිවිතුර ප්‍රාදේශීය සභාවේ දැනට ස්ථිර/අනියම්/ආදේශක/තාවකාලික/කොන්ත්‍රාත් පදනම මත සේවය කරන සේවකයින් සඳහා ප්‍රමුඛතාවය දෙනු ලැබේ.
02. ඉල්ලුම්පත් භාර ගන්නා අවසාන දිනට වයස අවුරුදු 18 ට නොඅඩු සහ 45 ට නොවැඩි විය යුතු ය.
    (දැනට ස්ථිර සේවයේ නියුක්ත අයට උපරිම වයස් සීමාව බල නොපැවැත්වේ)
03. අයදුම්කරු දණ්ඩ නීති සංග්‍රහය යටතේ උසාවියක වරදකරුවකු කරනු ලැබුවකු හෝ පළාත් රාජ්‍ය සේවයෙන් පහකරනු ලැබුවකු නොවිය යුතු ය.
04. අයදුම්පත් කැඳ වීමෙන් පසු හෝ කැඳවන අතරතුර කාල සීමාවේ දී හෝ මෙම බඳවා ගැනීම් ප්‍රමාද කිරීම හෝ වෙනස් කිරීම හෝ මෙම නිවේදනය අවලංගු කිරීම හෝ සංශෝධනය කිරීම වැලිවිටිය - දිවිතුර ප්‍රාදේශීය සභාවේ ලේකම් සතුය.

*බඳවා ගැනීමේ ක්‍රමය :*

01. සම්මුඛ පරීක්ෂණයකින් පසුව තෝරාගනු ලැබේ.
02. නියමිත සුදුසුකම් සපුරා ඇති අය පමණක් සම්මුඛ පරීක්ෂණය සඳහා කැඳවනු ලැබේ.

*සේවයේ නියුක්ත කරවීමේ කොන්දේසි :*

01. මෙම තනතුර ස්ථිරය. විශ්‍රාම වැටුප් සහිතය.
02. වැන්දඹු අනත්දරු අරමුදලට දායකත්වය හිමිවේ.
03. පත්වීම අවුරුදු 03 ක පරිවාස කාලයකට යටත් වන අතර, වසර තුන (03) අවසානයේ වැඩ, පැමිණීම හා හැසිරීම යහපත් තත්ත්වයේ සිටින සේවකයින්ට පමණක් ස්ථිර පත්වීම් ප්‍රදානය කරනු ලැබේ.
04. මෙම බඳවා ගැනීම ශ්‍රී ලංකා ජනරජයේ ආයතන සංග්‍රහයේ රෙගුලාසිවලට ද, මුදල් රෙගුලාසිවලටද, දෙපාර්තමේන්තු නියෝගවලට ද, රජයේ හෝ දකුණු පළාත් සභාව විසින් වරින්වර නිකුත් කරනු ලබන වෙනත් රෙගුලාසි හා නියෝගවලට ද අනුකූලව ක්‍රියා කිරීමට සියලුම සේවකයින් බැඳී සිටිය යුතු ය.

*ඉල්ලුම් කරනු ලබන ආකාරය :*

අයදුම්කරු මෙහි දක්වා ඇති ආදර්ශ අයදුම්පත අනුව A4 ප්‍රමාණයේ කඩදාසියක පිළියෙල කරන ලද අයදුම්පත් 2014.06.15 වැනි දිනට හෝ ඊට පෙර ලැබෙන සේ "ලේකම්, වැලිවිටිය - දිවිතුර ප්‍රාදේශීය සභාව, අගලිය" යන ලිපිනයට ලියාපදිංචි තැපෑලෙන් එවිය යුතු ය. අයදුම්පත් බහාලන කවරයේ වම්පස ඉහළ කෙළවරේ ඉල්ලුම් කරනු ලබන තනතුර සඳහන් කළ යුතු ය. අසම්පූර්ණ අයදුම්පත් ප්‍රතික්ෂේප කරන අතර, නියමිත දිනට පසුව ලැබෙන අයදුම්පත් ද ප්‍රතික්ෂේප කරනු ලැබේ.

අයදුම්පත සමග පහත සඳහන් සහතිකවල පිටපත් ඇමිණිය යුතු අතර, මුල් පිටපත් සම්මුඛ පරීක්ෂණයේ දී ඉදිරිපත් කළ යුතු ය :-

1. උප්පැන්න සහතිකය;
2. අධ්‍යාපන සහතික;

3. පදිංචිය සහතික කිරීම පිණිස මෑතක දී ලබා ගත් ග්‍රාම නිලධාරි සහතිකය; (ප්‍රාදේශීය ලේකම් අනු අත්සන් කරන තිබිය යුතු ය.)
4. මෑතක දී ලබා ගත් චරිත සහතික දෙකක්;
5. පළපුරුද්ද පිළිබඳ සහතික;
6. වැලිවිටිය - දිවිතුර ප්‍රාදේශීය සභාවේ සේවය කරන්නේ නම් සේවා සහතිකයක්.

ලොකුගේ ගුණසිරි,
සභාපති,
වැලිවිටිය - දිවිතුර ප්‍රදේශීය සභාව.

2014 අප්‍රේල් මස 28 වැනි දින,
වැලිවිටිය - දිවිතුර ප්‍රාදේශීය සභා කාර්යාලයේ දී ය.

**ආදර්ශ අයදුම්පත්‍රය**

**.................................................................................................. *තනතුර සඳහා අයදුම්පත්‍රය***

01. අයදුම්කරුගේ නම මුලකුරු සමග :—————.
02. මුලකුරු වලින් හැඳින්වෙන නම :—————.
03. ස්ථිර පදිංචි ලිපිනය :—————.
04. දුරකථන අංකය :—————.
05. දිස්ත්‍රික්කය :—————.
06. උපන් දිනය :—————.
07. ජාතික හැඳුනුම්පත් අංකය :—————.
08. අයදුම්පත් භාර ගන්නා දිනට වයස :
    අවුරුදු :—————. මාස :—————. දින :—————.
09. ස්ත්‍රී/පුරුෂ භාවය :—————.
10. විවාහක/අවිවාහක බව :—————.
11. ජාතිය :—————.
12. ශ්‍රී ලාංකික පුරවැසියෙක් ද, එසේ නම් පරම්පරාවෙන් ද/ලියාපදිංචි වීමෙන් ද? :—————.
13. අ.පො.ස. (සා.පෙළ) විභාගය, වර්ෂය :—————.

| *විෂයය* | *සාමාර්ථය* | *විෂයය* | *සාමාර්ථය* |
|---|---|---|---|
| 1 | | 5 | |
| 2 | | 6 | |
| 3 | | 7 | |
| 4 | | 8 | |

14. පළපුරුද්ද හා වෘත්තීය සුදුසුකම් :—————.
15. ඔබ දැනටමත් වැලිවිටිය - දිවිතුර ප්‍රාදේශීය සභාවේ සේවය කරන්නේ නම් -
    දැනට දරන තනතුර :—————.
    එම තනතුරට පත් වූ දිනය :—————.
    එම පත්වීමේ ස්වභාවය (ස්ථිර/අනියම්/තාවකාලික/ආදේශක/කොන්ත්‍රාත් පදනම මත ද):—————.

මෙම අයදුම්පත්‍රයේ මා විසින් සපයන ලද තොරතුරු සත්‍ය වූත්, නිවැරදි වූත් ඒවා බව මම මෙයින් සහතික කරමි.

මෙහි ඇතුළත් තොරතුරු කිසිවක් අසත්‍ය හෝ වැරදි බව මෙම තනතුරට තෝරා ගැනීමට පෙර අනාවරණය වුවහොත්, මා නුසුදුස්සකු වන බවත්, පත්වීම ලැබීමෙන් පසු එවැනි කරුණක් ඔප්පු වුවහොත්, කිසිදු වන්දියක් නොගෙවා සේවයෙන් පහ කරනු ලැබීමට යටත් වන බවත් දන්වමි.

—————.
අයදුම්කරුගේ අත්සන

දිනය :—————.

*දැනට සේවයේ නියුතු අයදුම්කරුවන් සඳහා ආයතන ප්‍රධානියාගේ සහතිකය*

මෙම ඉල්ලුම්කරු වන......................................... මහතා/මහත්මිය/මෙනවිය දැනට මෙම කාර්යාලයේ ............................................. වශයෙන් සේවය කරයි. අයදුම්පත නිර්දේශ කර/නිර්දේශ නොකර ඉදිරිපත් කරමි.

—————.
ආයතන ප්‍රධානියාගේ අත්සන
(නිල මුද්‍රාව)

දිනය :—————.

05-401

# පළාත් පාලන නිවේදන

## උඩුනුවර ප්‍රාදේශීය සභාව

1987 අංක 15 දරන ප්‍රාදේශීය සභා පනතේ 24(01) වැනි වගන්තිය යටතේ කරනු ලබන දැන්වීම

1987 අංක 15 දරන ප්‍රාදේශීය සභා පනතේ 24(1) වැනි වගන්තිය ප්‍රකාර මධ්‍යම පළාතේ, මහනුවර දිස්ත්‍රික්කයේ, උඩුනුවර ප්‍රාදේශීය සභාව විසින් මෙහි පහත සඳහන් උපලේඛනයේ දක්වා ඇති මංමාවත් උඩුනුවර ප්‍රාදේශීය සභාව සතු මංමාවත් වශයෙන් ප්‍රකාශයට පත් කරනු ලබන බව මෙයින් නිවේදනය කරනු ලැබේ. මේ පිළිබඳව ප්‍රදේශයේ පොදු ජනතාව විසින් හෝ මංමාවත්වලට අදාළ ඉඩම්වල හිමිකරුවන් ලෙස හිමිකම් පාන පාර්ශ්වයන් හෝ යම් විරෝධතාවයක් පල කරනු ලබන්නේ නම් මෙම නිවේදනය ගැසට් පත්‍රයේ පලවූ දින සිට එක් මසක් ඇතුළත තමන්ගේ අයිතිය ඔප්පු කිරීම සඳහා 1987 අංක 15 දරන ප්‍රාදේශීය සභා පනතේ 24(11) වැනි වගන්ති ප්‍රකාරව ක්‍රියා කරන ලෙස මින් දැනුම් දෙනු ලැබේ. එසේ වන ලිපි ලියාපදිංචි තැපෑලෙන් එවිය යුතු ය.

මෙම කාල සීමාව තුළ මෙම නිවේදනය පිළිබඳ යම් විරෝධතාවයක් නොවුණහොත් උපලේඛනයේ සඳහන් මංමාවත් උඩුනුවර ප්‍රාදේශීය සභාව සතු මංමාවත් වශයෙන් පිළිගෙන පාලනය කරනු ලබන බව පොදු ජනතාවගේ දැනගැනීම සඳහා මෙයින් ප්‍රකාශයට පත් කරමි.

ආර්. එම්. බන්දුල සෙනෙවිරත්න,
සභාපති,
උඩුනුවර ප්‍රාදේශීය සභාව,
ගෙලිඔය.

| අනු. අංකය | මාර්ගයේ නම | ආරම්භය | අවසානය | වම්පස අයිතිකරුවන් | දකුණු පස අයිතිකරුවන් | දිග | පළළ |
|---|---|---|---|---|---|---|---|
| 01 | අරුක්කුඹුරේ සිට ගමරාලවත්ත හරහා යන පාර | අරුක්කුඹුර | ගමරාලවත්තේ ඉම | 01. එස්. එම්. ලොකුමැණිකේ<br>02. ජේ. එම්. ප්‍රියන්ත සම්පත් රත්නායක | 01. එස්. එම්. රත්නායක<br>02. එස්. එම්. උක්කුබංඩා<br>(වම/දකුණ දක්වා නැත) | අඩි 250 | අඩි 8 |
| 02 | කෝවිලේහේන පාර | ගෙලිඔය පේරාදෙණිය ප්‍රධාන මාර්ගයේ සිට | කෝවිලේහේන නැමැති ඉඩමෙන් යන මාර්ගය | 01. බී. ඩී. එම්. ධර්මලතා මැණිකේ<br>02. බී. ඩී. එම්. විජේරත්න<br>(වම/දකුණ දක්වා නැත) | 01. ඩී. එම්. බී. එස්. එම්. ධනසේකර රත්නායක<br>02. ඩී. එම්. විජේරත්න<br>03. බී. ඩී. එම්. සෝමලතා ධනසේකර<br>04. බී. ඩී. එම්. ඉන්ද්‍රාවතී මැණිකේ<br>05. ඩබ්ලිව්. ඇම්. පුලතිෂි බණ්ඩාර සේනානායක<br>06. ඩබ්ලිව්. එම්. සී. කේ. බස්නායක<br>07. බී. ඩී. ඇම්. ශාන්තිලතා මැණිකේ<br>08. බී. බස්නායක<br>(වම/දකුණ දක්වා නැත) | අඩි 350 | අඩි 10 |
| 03 | දස්කර මුස්ලිම් පල්ලිය පරතලාව කෙහෙල්වල දස්කර පාසල පාර | දස්කර ජුම්මා පල්ලිය අසලින් | දස්කර ජාතික පාසල තලවතුර පාර | 01. බී. එම්. මහුරුප්<br>02. බී. එම්. සාදිකින්<br>03. එස්. එම්. අස්මි<br>04. එම්. එස්. එම්. සිද්දික්<br>05. එම්. එස්. එම්. රිස්වාන්<br>06. එම්. ආර්. එම්. රසාද්<br>07. එම්. ඒ. ඒ. සල්මාන්<br>08. ජේ. එම්. නිසාර්<br>09. එන්. ඒ. උම්මා<br>10. එම්. ආර්. නුර්ලයිවා<br>11. එම්. ආර්. කයිරුන් නිශා<br>12. එම්. ආර්. එම්. නදීර්<br>13. එච්. එල්. ජෙම්බරත් (එස්. එම්. නියාස්)<br>14. උම්මු සල්මා | 01. පල්ලිය<br>02. පල්ලිය<br>03. එච් එල්. රම්සාන්<br>04. එච්. එල්. සනිෂා<br>05. පල්ලිය<br>06. පල්ලිය-එම්. අයි. එම්. හනිෆා<br>07. එස්. එම්. නියාස්<br>08. ඒ. එස්. එම්. මුනෆ් | මීටර් 350 | මීටර් 3 |

05-460

**මොරටුව මහ නගර සභාව**

ගෝසාතක ආඥාපනත (272 වැනි අධිකාරය)

මෙහි පහත උපලේඛනයෙහි සඳහන් අය විසින් එම උපලේඛනයෙහි සඳහන් ස්ථානවල මස් වෙළඳාම සඳහා මස් කඩයක් පවත්වාගෙන යාම පිණිස 2014 වර්ෂයට බලපත්‍ර ඉල්ලුම් කර තිබෙන බවත්, ඒ අනුව බලපත්‍ර නිකුත් කිරීම සඳහා මොරටුව මහ නගර සභා සීමාව තුල පදිංචි යම් අයෙක් විරුද්ධ වන්නේ නම් එසේ විරුද්ධ වීමට හේතු සඳහන් කර පිටපත් දෙකකින් යුක්තව මෙම දැන්වීම ගැසට් පත්‍රයේ පලවූ දින සිට දින 14ක් ඇතුලත මා වෙත ලියා එවීමට බලය ඇති බවත්, (272 වැනි අධිකාරය) ගෝසාතක ආඥාපනතේ 7 වැනි වගන්තිය යටතේ මෙයින් දැනුම් දෙනු ලැබේ.

එච්. එන්. එස්. අංගම්මන,
නාගරික කොමසාරිස්,
මොරටුව මහ නගර සභාව.

2014 අප්‍රේල් මස 28 වැනි දින,
මොරටුව මහ නගර සභාවේ දී ය.

**උපලේඛනය**

| | *ඉල්ලුම්කරුගේ නම සහ ලිපිනය* | *වෙළඳාම් කරන ස්ථානය* | *වෙළඳාමෙහි ස්වභාවය* |
|---|---|---|---|
| 1. | අමීර් අම්සාර් මොහොමඩ් රිෂාඩ්<br>අංක 66/32, සාවියා පාර, හේනමුල්ල<br>පානදුර. | කටුබැද්ද නගර සභා වෙළඳපොල | ගවමස් |
| 2. | මොහොමඩ් ඉෆාම්<br>අංක 04, ගාලු පාර, ඉන්දිරිලිගොඩ<br>මග්ගොන. | දිගරොල්ල දිනපොල නගර සභා කඩ | ගවමස් |
| 3. | හනිෂා සිත්ති ෆයානි<br>අංක 22, කරුනාරත්න පාර,<br>හේනමුල්ල, පානදුර. | උස්වත්ත නගර සභා කඩ | ගවමස් |
| 4. | අබ්දුල් අසීස් හයාතුල් බාවා<br>අංක 179/2ඒ, ගාළු පාර,<br>රත්මලාන | උයන නගර සභා කඩ | ගවමස් |
| 5. | ජවුපර් සාදික් මොහොමඩ් අලි<br>333, II අදියර, බඩෝවිට, ගල්කිස්ස | දිගරොල්ල දිනපොල නගර සභා කඩ | කුකුළු මස් |
| 6. | එම්. එෆ්. එම්. රෂීඩ්<br>අංක 26/1, ගාලුපාර, මොරටුව | මධ්‍යම වෙළඳපොල නගර සභා කඩ | ගවමස් |
| 7. | එම්. එෆ්. එම්. රෂීඩ්<br>අංක 26/1, ගාලු පාර, මොරටුව | මධ්‍යම වෙළඳපොල නගර සභා කඩ | එළුමස් |
| 8. | එම්. එෆ්. එම්. රෂීඩ්<br>අංක 26/1, ගාලු පාර, මොරටුව. | කොරළවැල්ල නගර සභා කඩ | ගවමස් |

05-521

---

**ශ්‍රී ජයවර්ධනපුර කෝට්ටේ මහ නගර සභාව**

ශ්‍රී ලංකා නීති ප්‍රඥප්තියේ 252 අධිකාරය වන මහ නගර සභා ආඥාපනතේ 37(1) වගන්තිය යටතේ කරනු ලබන දැන්වීම

ශ්‍රී ලංකා නීති ප්‍රඥප්තියේ 252 අධිකාරය වන මහ නගර සභා ආඥාපනතේ 37(1) “ආ” වගන්තිය ප්‍රකාරව, බස්නාහිර පළාතේ, කොළඹ දිස්ත්‍රික්කයේ, පිහිටි ශ්‍රී ජයවර්ධනපුර කෝට්ටේ මහ නගර සභාව විසින් අංක 1664 දරන 2010.07.23 වැනි දිනැති ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට්

පත්‍රයේ ශ්‍රී ජයවර්ධනපුර කෝට්ටේ මහ නගර සභාව සතු මංමාවතක් වශයෙන් ප්‍රකාශයට පත් කර පළ කරන ලද පහත සඳහන් මාර්ගය ඉදිරියෙන් දක්වා ඇති දිග හා පළල අනුව ශ්‍රී ජයවර්ධනපුර කෝට්ටේ මහ නගර සභාව සතු දේපළක් ලෙසට සලකා නඩත්තු කරනු ලබන බවට ප්‍රසිද්ධ කරනු ලැබේ.

ශාන්තා පී. ලියනගේ,
නාගරික කොමසාරිස්,

2014 අප්‍රේල් මස 29 වැනි දින,
ශ්‍රී ජයවර්ධනපුර කෝට්ටේ මහ නගර සභා කාර්යාලයේ දී ය.

| අනු. අංකය | පාරේ නම | මායිම් සීමාව සිට දක්වා | දිග මීටර් | පළල මීටර් |
|---|---|---|---|---|
| 01. | තලවතුගොඩ පාර වරිපනම් අංක 116/3 සිට 15 දක්වා ඇති මාර්ගය | වරිපනම් අංක 116/3 සිට 116/6ඒ සහ 116/6බී දක්වා | 70 | 3 |
| | | 116/6ඒ සහ 116/6බී සිට 116/12 දක්වා මාර්ගය | 27.5 | 2.3 |

05-415

# ආදායම් හා වියදම් පිළිබඳ වාර්තා

## පඩුවස්නුවර ප්‍රාදේශීය සභාව

2013 දෙසැම්බර් මස 31 වැනි දිනට ශේෂ පත්‍රය

| | | 2012 | | 2013 | |
|---|---|---|---|---|---|
| (1) | ස්ථාවර වත්කම් | | 128,544,324.25 | | 146,075,861.43 |
| (2) | ජංගම වත්කම් | | | | |
| | 120 අතැති තොග | 1,963,213.20 | | 1,963,213.20 | |
| | 130 උපයෝගී සේවා සඳහා ණය | | | | |
| | 140 සේවක ණය | 7,193,584.52 | | 7,267,455.35 | |
| | 150 අයකර ගත හැකි උපයෝගී සේවා | | | | |
| | 160 ආදායම් ණයගැතියෝ | 24,891,672.22 | | 65,251,726.41 | |
| | 170 පෙර ගෙවුම් | 6,502,746.75 | | 2,375,000.00 | |
| | 180 ආයෝජන | 9,720,490.32 | | 1,489,012.64 | |
| | 190 මුදල් | 14,66,430.69 | | 2,051,904.47 | |
| ජංගම වත්කම් එකතුව | | 51,738,137.70 | | 80,398,312.07 | |
| (3) | අඩු නළා - ජංගම වගකීම් | | | | |
| | 230 ණය හිමියෝ | 53,951,615.63 | | 44,197,639.60 | |
| | 240 කලින් ලැබීම් | 213,282.91 | | 350,241.11 | |
| | 250 ආපසු ගෙවිය යුතු තැන්පතු | 9,036,842.16 | | 10,557,916.94 | |
| | ජංගම වගකීම් එකතුව | 63,201,740.70 | | 55,105,797.65 | |
| | කාරක ප්‍රාග්ධනය/ඌණ කාරක ප්‍රාග්ධනය | | -11,463,603.00 | | 25,292,514.42 |
| | ශුද්ධ වත්කම් | | 117,080,721.25 | | 171,368,375.85 |
| | මුදල් යොදවන්නේ | | | | |
| | 210 සමුච්චිත අරමුදල හා සංචිත | | 94,680,601.60 | | 150,192,055.16 |
| | 220 ණය ප්‍රාග්ධනය | | 22,400,119.65 | | 21,176,320.69 |
| | | | 117,080,721.25 | | 171,368,375.85 |

එමල් ප්‍රියන්ත හේරත්,
සභාපති,
පඩුවස්නුවර ප්‍රාදේශීය සභාව.

05-456/1

පඹුවස්නුවර ප්‍රාදේශීය සභාව

2013 දෙසැම්බර් මස 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා ආදායම් සහ වියදම් ගිණුම

| | 1 පොදු පරිපාලනය | 2 සෞඛ්‍ය සේවා | 3 භෞතික සැලසුම් මංමාවත් සහ ඉඩම් ගොඩනැගිලි | 4 ජල සේවා | 5 වෙනත් උපයෝගී | 6 සුභසාධක සේවා | එකතුව |
|---|---|---|---|---|---|---|---|
| 1. පුනරාවර්තන ආදායම් | | | | | | | |
| (10) වරිපනම් හා බදු | 1,829,210.01 | 18,000.00 | 0.00 | 0.00 | 0.00 | 292,743.00 | 2,139,953.01 |
| (20) කුලී | 0.00 | 0.00 | 5,445,343.00 | 0.00 | 8,589,801.26 | 85,508.00 | 14,120,652.26 |
| (30) බලපත්‍ර ගාස්තු | 184.00 | 1,952,037.28 | 0.00 | 0.00 | 0.00 | 6,000.00 | 1,958,221.28 |
| (40) සේවා ගාස්තු | 37,800.00 | 212,256.00 | 16,232,102.80 | 142,926.70 | 0.00 | 116,162.00 | 16,741,247.50 |
| (50) වරෙන්තු ගාස්තු හා දඩ | 12,500,000.00 | 0.00 | 86,706.16 | 0.00 | 60,125.80 | 12,018.75 | 12,658,850.71 |
| (60) වෙනත් ආදායම් | 2,534,251.43 | 63,679.16 | 30,000.00 | 2,621,207.00 | 0.00 | 221,295.00 | 5,470,432.59 |
| (70) ආදායම් ආධාර | 21,872,468.79 | 0.00 | 0.00 | 0.00 | 0.00 | 0.00 | 21,872,468.79 |
| පුනරාවර්තන ආදායම් එකතුව | 38,773,914.23 | 2,245,972.44 | 21,794,151.96 | 2,764,133.70 | 8,649,927.06 | 7,33,726.75 | 74,961,826.14 |
| 2. පුනරාවර්තන වියදම් | | | | | | | |
| (01) වැටුප් හා දීමනා | 14,505,404.46 | 3,968,545.22 | 8,542,136.56 | 381,549.69 | 648,059.57 | 3,087,065.74 | 31,132,761.24 |
| (02) ගමන් වියදම් | 380,947.40 | 14,440.00 | 71,449.60 | 2,070.00 | 0.00 | 10,498.00 | 479,405.00 |
| (03) සැපයුම් හා උපකරණ | 20,061,52.80 | 1,113,459.60 | 3,051,809.50 | 315,939.81 | 94,727.90 | 268,998.90 | 6,851,088.51 |
| (04) ප්‍රාග්ධන වත්කම් අලුත්වැඩියා හා නඩත්තු | 1,763,576.00 | 296,207.50 | 5,796,890.53 | 426,296.37 | 1,510,129.36 | 14,100.00 | 9,807,199.76 |
| (05) ප්‍රවාහන, සම්න්ධතා ආවශ්‍යක හා වෙනත් සේවා | 1,403,552.64 | 843,471.97 | 133,460.08 | 2,494,765.51 | 211,592.01 | 179,631.83 | 5,266,474.04 |
| (06) පොළී ගෙවීම්, ලාභාංශ හා ප්‍රසාද මුදල් | 0.00 | 0.00 | 722,727.11 | 0.00 | 1,257,626.93 | 0.00 | 1,980,354.04 |
| (07) ආධාර මුදල්, දායක මුදල් හා සහනාධාර | 807,674.53 | 559,900.00 | 0.00 | 0.00 | 0.00 | 3,993,627.90 | 5,361,202.43 |
| (08) විශ්‍රාම වැටුප් විශ්‍රාම ප්‍රතිලාභ හා පාරිතෝෂික | 50,178,82 | 70,687.59 | 4,779.99 | 10,999.52 | 0.00 | 44,272.72 | 180,918.64 |
| පුනරාවර්තන වියදම් එකතුව | 20,917,486.65 | 6,866,711.88 | 18,323,253.37 | 3,631,620.90 | 3,722,135.77 | 7,598,195.09 | 61,059,403.66 |
| පුනරාවර්තන වියදමට වඩා වැඩිවූ/ අඩුවූ ආදායම/වියදම | 17,856,427.58 | -4,620,739.44 | 3,470,898.59 | -867,487.20 | 4,927,791.29 | -6,864,468.34 | 13,902,422.48 |
| 3. ප්‍රාග්ධන ආදායම් | | | | | | | |
| (81) මූලධන ආධාර | 193,744.22 | 2,279,988.60 | 40,223,503.00 | 0.00 | 0.00 | 0.00 | 42,697,235.82 |
| (82) ප්‍රාග්ධන වත්කම් විකුණුම් පුනරාවර්තන වියදමට වඩා වැඩිවූ ආදායම සහ ප්‍රාග්ධන ආදායම්වල එකතුව | 18,050,172.80 | -2,340,750.84 | 43,694,401.59 | -867,487.20 | 4,927,791.29 | -6,864,468.34 | 56,599,658.30 |
| 4. ප්‍රාග්ධන වියදම් | | | | | | | 0.00 |
| (09) ප්‍රාග්ධන වැය | 4,058,111.82 | 2,284,788.58 | 46,869,019.50 | 949,648.30 | 901,984.88 | 490,873.00 | 55,554,426.08 |
| අතිරික්තය/ඌණතාවය | 13,992,059.98 | -4,625,539.42 | -3,174,617.91 | -1,817,135.50 | 4,025,806.41 | -7,355,341.34 | 1,045,232.22 |

එමල් ප්‍රියන්ත හේරත්,
සභාපති,
පඹුවස්නුවර ප්‍රාදේශීය සභාව.

05-456/2

ශ්‍රී ලංකා රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුවේ මුද්‍රණය කරන ලදී.